## 12 ශ්‍රේණිය ව්‍යාපාර සංඛ්‍යානය 9 වන සතිය - ජූනි 29 සිට ජූලි 03 දක්වා

## 6.3 නියැදිකරණය සඳහා නිස්සසම්භාවී නියැදීම් ක්‍රම භාවිත කරයි.

### නිස්සසම්භාවී නියැදීම් ක්‍රමය

- සම්භාවිතා පදනමක් නොමැතිව සංගහනයකින් අභිමත පරිදි නියැදියක් තෝරා ගැනීම නිස්සසම්භාවී නියැදීම ලෙස හැඳින්වේ.
- සසම්භාවී නියැදියක් තෝරා ගැනීමට අපහසු අවස්ථාවලදී,කඩිනමින් නියැදියක් තෝරා ගත යුතු අවස්ථාවලදී,සංගහනය විශාල භූගෝලීය ප්‍රදේශයක ව්‍යාප්ත වී ඇති අවස්ථාවලදී,මෙන්ම අරමුණට යෝග්‍ය නියැදියක් තෝරා ගත යුතු වන අවස්ථාවලදී මෙම ක්‍රමය යොදා ගනී.

#### කොටස් නියැදීමේ වාසි

1.සම්භාවිතා නියැදීමකදී මෙන් නොව කලින් තෝරා ගත් පිරිසක් හමු වීම සඳහා සංගහනය පුරා ගමන් කිරීම අනවශ්‍ය බැවින් ගත වන කාලය හා දැරීමට සිදුවන පිරිවැය අවම වීම.
2.කොටස් නියැදීමකදී පරිපාලන සහ අධීක්ෂණ කටයුතු පහසු වීම.
3.සසම්භාවී නියැදීමකදී මෙන් නියැදිය තේරීමට දැඩි අපහසුතාවක් ඇති නොවීම.
4.නියැදි රාමුවක් අවශ්‍ය නොවීම.
5.අන්වේක්ෂකයාගේ පළපුරුද්ද මත හොඳ නියැදියක් ලබා ගත හැකි වීම.
6.සංගහනය ප්‍රවර්ග වන පැතිකඩ වැඩි වන විට නිරූප්‍ය නියැදියක් ලැබීම.

#### කොටස් නියැදීමේ අවාසි

1.නියැදිය තෝරා ගැනීමට පුද්ගලබද්ධතා බලපාන බැවින් නිරූප්‍ය නියැදියක් නොලැබීම.
2.අනුමිතීන් කිරීමට අවශ්‍ය සම්භාවිතා පදනමක් නොමැතිවීම නිසා සංඛ්‍යානමය නිගමනයන්ට එළඹීමට අපහසු වීම.
3.කොටස් නියැදීමට පදනම් විය හැකි සමාජ පන්තිය වැනි නිර්ණායක හඳුනා ගැනීම දුෂ්කර වීම.
4.නියැදීමේ ප්‍රතිඵලවල ප්‍රයෝජනවත් බව අඩුවීම එනම් ප්‍රතිඵලයන්හි විශ්වසනීයතාව ඇගයීමට නොහැකි වීම.

#### අභ්‍යාස

1.සම්භාවිතා නියැදීම හා සම්භාවිතා නොවන නියැදීම අතර වෙනස්කම් 4ක් ලියන්න.

2.සම්භාවිතා නොවන නියැදීම් ක්‍රම 4ක් නම් කර පැහැදිලි කරන්න.